# INFORMATION SYSTEMS (Part - VI)

***S. Madushanka***


***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# තොරතුරු තාක්ෂණය

විදුලි සන්දේශ හා පරිගණක තාක්ෂණය ඔස්සේ වාචික, රූපමය, අක්ෂරමය හා අංකමය තොරතුරු අත්පත් කර ගැනීම, සැකසීම, ගබඩා කිරීම හා බෙදා හැරීම තොරතුරු තාක්ෂණය ලෙස හැඳින්වේ.

## තොරතුරු තාක්ෂණය විවිධ ක්ෂේත්‍ර කීපයක එකතුවකි.




ClassWork.LK

# ගණනය කිරීමේ තාක්ෂණය

ගණනය කිරීමේ තාක්ෂණය යනු තොරතුරු පද්ධතිවල ගණනය කිරීම සිදු කිරීම පිළිබඳව අධ්‍යයනය යි. වර්තමාන ගණනය කිරීමේ ප්‍රධාන උපකරණය පරිගණකය නිසා මෙය පරිගණක තාක්ෂණය ලෙස ද සමහර අවස්ථාවල දී හඳුන්වයි.

මේ අනුව තොරතුරු තාක්ෂණය හදාරන්නකු පරිගණක තාක්ෂණය ද හැදෑරිය යුතු යි. වර්තමානයේ මෙම ක්ෂේත්‍රය ඉතා දියුණු වී ඇති අතර ඉතා ම නිවැරදි ව ම තත්පරයකට බිලියන ගණනක් ගණනය කළ කළ හැකි පරිගණක බිහි වී තිබේ.

Class Work.LK

## සන්නිවේදන තාක්ෂණය

සකස් කරන ලද දත්ත අදාළ පාර්ශ්වය වෙත බෙදා හැරීමට උපයෝගී කරගනු ලබන තාක්ෂණය යි. සාම්ප්‍රදායික ක්‍රමයේ දී අත්හුරු ක්‍රමයට සැකසූ තොරතුරු භෞතික ව අතින් ගෙන ගොස් භාර දුන්න ද අද පරිගණක ගත ජාල ඔස්සේ ක්ෂණයකින් ලෝකයේ කවර ම හෝ තැනකට බෙදා හරින්නේ සන්නිවේදන තාක්ෂණය ඔස්සේ ය.

## තොරතුරු කළමනාකරණ තාක්ෂණය

ආයතනයක් සතු පරිගණක තාක්ෂණය හා සන්නිවේදන තාක්ෂණය මැනවින් හසුරුවමින් තොරතුරු සම්පත කාර්යක්ෂම ව හා සඵලදායි ව භාවිත කිරීමේ ක්‍රියාවලිය තොරතුරු කළමනාකරණ තාක්ෂණය යි.

ClassWork.LK

ආයතනයකට කෙතරම් දියුණු පරිගණක හා සන්නිවේදන පහසුකම් තිබුණත් තොරතුරු සකසා සම්ප්‍රේෂණය කිරීමට හා ඒවා සඵලදායී ව යොදා ගැනීමට වැඩ පිළිවෙලක් නොතිබුනහොත් ඒවායින් ප්‍රයෝජනයක් ගත නොහැකි වේ.තොරතුරු තාක්ශණය භාවිතා කරන සංවිධාන තුල තොරතුරු කළමණාකරණය පිළිබඳව නිසි අවබොධයකින් තොරව තාක්ෂණය භාවිත කිරීම නිසා විවිධ ගැටලු පැන නගී.

## <u>තොරතුරු තාක්ෂණයේ වැදගත්කම</u>

- වඩා නිවැරදි තීරණ ගැනීමට හැකි වීම හා තීරණ ගැනීම පහසු වීම.
- කටයුතුවල වැරදි අවම වීම හා විශ්වසනීයත්වය වැඩි වීම.
- ක්‍රියාවලි කාර්යක්ෂම ව සිදු කර ගත හැකි වීම.
- ක්‍රියාවලි සඵලදායි ව සිදු කර ගත හැකි වීම.

ClassWork.LK

- නිමැවුම්වල ගුණාත්මක භාවය ඉහළ යාම.
- තොරතුරු සඳහා ඉතා විශාල ගබඩා ධාරිතාවක් තිබීම.
- ක්‍රියාවලිය සඳහා වන පිරිවැය අඩු වීම.
- තරගකාරීත්වයට මුහුණ දීමට හැකි වීම.
- සන්නිවේදන ක්‍රියාවලිය පහසු වීම.
- පාරිභෝගිකයන් වෙත හෝ සේවාදායකයන් වෙත හෝ පහසුවෙන් ප්‍රවේශ විය හැකි වීම.
- ජාතීන් හා පුද්ගලයන් අතර පවතින දූරස්ථ බව අඩු වීම.
- ජනතාවට හා පාරිභෝගිකයන්ට වඩාත් කාර්යක්ෂම ව සේවයක් ලබා ගැනීමට අවස්ථාව ලැබීම.

ClassWork.LK

- නව දැනුම ජනනය හා බෙදා හැරීම ශීඝ්‍රයෙන් සිදු වන නිසා ජනතාවගේ අවබෝධය පුළුල් වීම.

- අන්තර්ජාතික වෙළෙඳාම ප්‍රසාරණය වීම.

## <u>තොරතුරු තාක්ෂණයේ ප්‍රතිලාභ</u>

- **වේගවත් බව**

ඉතා සංකීර්ණ දෑ වුවද ඉතා ම වේගයෙන් ලබා ගෙන වර්ග කොට නැවත භාවිත කිරීම සඳහා යොදා ගත හැකි වීම.

- **නිවැරදිතාව (Accuracy)**

එනම් පුද්ගලයන් අතින් වැරදි ඇති වීමට ඇති ඉඩකඩ විශාල ය. විද්‍යුත් තොරතුරු මෙහෙයුම් ක්‍රියාවලියට මිනිසුන් සහභාගි වන්නේ අඩුවෙන් නිසා සිදු වන වැරදි අවම ය.

ClassWork.LK

- **නම්‍යශීලී බව (Flexibility)**

ඉතා සියුම් ලෙස නොයෙකුත් කාර්යයන් සඳහා යොදා ගැනීමටත් එම කාර්යයන් අනුව වෙනස් කිරීමටත් හැකි වීම.

- **විශ්වාසවන්ත භාවය (Reliability)**

නිවැරදිතාව නිසා ඇති වන දෙයකි.

- **ගුණාත්මක භාවය වර්ධනය (Improved Quality)**

එනම් මෙම තාකෂ් ණකි තොරතරු ැ යොදා ගැනමී මන ෑ කරනු ලබන කටයුතු ද උසස් ගුණත්වයකින් යුක්ත ය.

- **වැඩි තොරතුරු ප්‍රමාණයක් කළමනාකරණය කිරීම**

තාක්ෂණය නිසා විශාල තොරතුරු ප්‍රමාණයක් ලබා ගත හැකි අතර ඒවා අවශ්‍ය පරිදි යොදා ගනිමින් තීරණ ගැනීම සඳහා භාවිත කිරීමට කළමනාකරණය කිරීමේ හැකියාව

ClassWork.LK

- **අඩු සේවක සංඛ්‍යාවක් ප්‍රමාණවත් වීම**

තාක්ෂණික මෙවලම් යොදා ගන්නා නිසා සේවක සංඛ්‍යාව අඩු වීම

- **අඩු ඉඩකඩ ප්‍රමාණවත් වීම**

තාක්ෂණික මෙවලම් භාවිතයට අඩු ඉඩකඩක් ප්‍රමාණවත් වීම

- **පිරිවැය අඩු වීම**

- **ඉහත සියලු කරුණු නිසා අරපිරිමැසුම් දායක වීම මඟින් පිරිවැය අවම කර ගැනීමට හැකියාව ලැබී ඇත.**

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura